ඇමුණුම 01

**"දිරිය පියස" නිවාස යෝජනා ක්‍රමය - 2023**

**(සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සහිත අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීමේ වැඩසටහන )**

**<u>උපදෙස් පත්‍රිකාව</u>**

අවුරුදු 60ට වැඩි අඩු ආදායම්ලාභි වැඩිහිටියන් (මාසික ආදායම රු 6,000/- අඩු) සදහා අලුතින් නිවසක් ඉදිකිරීමට හෝ පවතින නිවස අලුත් වැඩියාකර සංවර්ධනය කර ගැනීම වෙනුවෙන් සමාජ ආරක්ෂණ අරමුදලින් **රු 700,000.00 ක මුදලක්** ලබා දෙනු ලැබේ. ඒ සදහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී වයස අවුරුදු 60ට වැඩි **අඩුආදායම්ලාභි** වැඩිහිටියන් සදහා ප්‍රමුඛතාවය ලබා දෙන අතර ආබාධිත/තනිමාපිය පුද්ගලයන්ද ඒ සදහා සුදුසුකම්ලාභින් ලෙස සැලකිය හැක. ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පහත උපදෙස් පරිදි කටයුතු කලයුතු අතර එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත අවශ්‍ය ලේඛණ, ඡායාරූප, වාර්තා, සමග ලබාදිය යුතුවේ. දිස්ත්‍රික් කමිටුව මගින් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ප්‍රමුඛතා අනුපිළිවෙළට ප්‍රතිලාභින් 03 දෙනෙකු තෝරා ගත යුතුය. එම අයදුම්පත් **2023 අප්‍රේල් 30** දිනට පෙර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ලැබිමට සැලැස්විය යුතුය. ඒ අනුව දිස්ත්‍රික්කයක් සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙළට ප්‍රතිලාභීන් **දෙදෙනෙකු සඳහා මුලික අදියර වශයෙන් ආධාර ලබාදෙනු ලැබේ.**

**<u>සම්පූර්ණ කළ යුතු පොදු උපදෙස්</u>**

1. අයදුම්පත්‍රයෙහි සියලු කොටස් නිවැරදිව නිසි ලෙස සම්පූර්ණ කළ යුතුය.
2. 2022 වර්ෂයේ දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් නොවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ප්‍රමුඛතාවය ලබා දීම වඩාත් සුදුසු වන අතර කොට්ඨාශයේ සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සහිත අඩු ආදායම්ලාභී පවුල් අතරින් සුදුසුම පුද්ගලයා හෝ පවුල තෝරා එවීමට උත්සුක විය යුතුය.
    2.1. දිස්ත්‍රික්කය තුළ සීමිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රමාණයක් පවතින විට එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී එකම ග්‍රාම නිළධාරී වසමකින් එක් පුද්ගලයකු පමණක් වන පරිදි තෝරාගත යුතුය.
3. අයදුම්කරුගේ නිවසේ අබාධිත දරුවකු සිටීම සහ තනි මාපිය පවුලක් වීම අමතර සුදුසු කමක් ලෙස සැලකේ. ඒ අනුව අයදුම්කරුගේ නිවසේ වෙසෙන ආබාධිත දරුවන්/ ආබාධිත දීමනා ලැබීම ස්වශක්ති සංවිධාන සාමාජිකයෙකු වීම ආබාධිත බව තහවුරු කිරීමට ප්‍රමාණවත් වේ. එසේ නොවන අවස්ථාවක රජයේ රෝහලකින් හෝ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය වාර්තාවක් අමුණා තිබිය යුතුය. එසේම තනි මාපිය පවුලක් නම් විවාහ සහතික/ මරණ සහතිකය/ දික්කසාද සහතිකය හෝ අතහැර දමන ලද නම් දිවුරුම් ප්‍රකාශයක් මඟින් සනාථ කළ යුතුය.
4. නිවස ඉදිකිරීමට බලාපොරොත්තු වන ඉඩමේ අයිතිය අයදුම්කරු වෙත තිබේ නම් එම ඔප්පුවේ බලපත්‍රයේ පිටපතක් සහතික කර ඉදිරිපත් කළ යුතුය.
5. නිවස ඉදි කරන ඉඩමේ අයිතිය ඉල්ලුම්කරු හා ඔහුගේ බිරිද වෙත නොමැති නම්, ඉදිකරනු ලබන නිවසේ අදාළ වැඩිහිටියාට ජීවිතාන්තය දක්වා ජීවත් වීමට අවස්ථාව ලබා දෙන බවට පිළිගත හැකි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

6. ඉදි කිරීමට බලාපොරොත්තු වන නිවසට අදාළ ඇස්තමේන්තුව හා නිවාස සැලැස්ම තාක්ෂණික නිළධාරියෙකු විසින් සකස් කර නිල මුද්‍රාව තබා සහතික කළ යුතුය. **එම සැලැස්ම රුපියල් ලක්ෂ හත නොඉක්ම විය යුතු අතර එසේ නොවන්නේ නම් ඔබ විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත මුදල සපයා ගන්නා ආකාරය පිලිබදවන ලිඛිතව අප දැනුවත් කළ යුතුය.**
7. ඉල්ලුම්කරු දැනට පදිංචි නිවසේ පවුලේ සාමාජිකයන් සමඟ ලබා ගත් ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය.
8. අදාළ ඉල්ලීම් සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතිත්වයෙන් හා සමාජ සේවා නිළධාරී, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිළධාරීගේ සාමාජිකත්වයෙන් යුක්ත ත්‍රි-පුද්ගල කමිටුවක් විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර, එම නිර්දේශය සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.
9. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබෙන ඉල්ලීම් අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ සභාපතිත්වයෙන් හා, සහකාර දිස්ත්‍රික් ලේකම්, විෂය නිළධාරී ( දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී , දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීගේ ) සාමාජිකත්වයෙන් යුක්ත කමිටුවක් විසින් සලකාබලා ඒ අතුරින් ඉල්ලීම් 03 ක් පමණක් තෝරා ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට ඉදිරිපත් කළයුතුය.පළමුවටය සදහා සදහන්කර ඇති අනුපිළිවෙලට අනුව මුල්නිවාස දෙකට ආධාර ලබාදීමට කටයුතු කරනු ලැබේ.
10. මෙම ඉල්ලීම් පරීක්ෂා කර බලා අදාල මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිදහස් කරනු ලබන අතර, ඒ අනුව **නොවැම්බර් 30 දින** වන විට සම්පූර්ණ ඉදිකිරීම් අවසන් කළ යුතු ය. මෙම ඉදිකිරීම් ආරම්භයේ සිට අවසානය දක්වා දිස්ත්‍රික් සමාජ සේවා නිළධාරී/ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිළධාරී සම්පූර්ණ අධීක්ෂණයට ලක්විය යුතුය.
11. ආධාර ලැබීමෙන් අනතුරුව චෙක්පතට අදාළ ලදුපත සහ එම කාර්ය නිමකල පසු, වැඩ අවසන් කිරීමේ වාර්තා , ඡායාරූප සහිතව, වියදම් ඇස්තමේන්තු ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.
12. අවුරුදු 70 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මාසිකව ගෙවන ලබන මාසික දීමනාව ආබාධිත පුද්ගලයින් සඳහා ගෙවනු ලබන රුපියල් 5,000 දීමනා ලබන පවුල් ද මෙම යෝජනා ක්‍රමයට අයදුම් කළ හැක.
13. **මුදල් නිකුත් කිරීමේදී ලබා දෙන උපදෙස් හා දිනයන් සම්බන්ධව ඔබගේ දැඩි අවධානය යොමු වියයුතු අතර, නොවැම්බර් 30 දින වන විට වැඩ අවසන් නොවන දිරිය පියස ව්‍යාපෘති සම්බන්ධව දිස්ත්‍රික් නිළධාරී වගකිව යුතුව ඇත.**
14. **මෙම මුදල මඟින් කිසි විටෙකත් ප්‍රයෝජනයට ගත නොහැකි වනසේ නිවසකින් අඩක් නිම කිරීම නොකළ යුතුය.**

කේ.ජී.ලැනරෝල්
අධ්‍යක්ෂ